මහත් ප්‍රේමයේ පීඩාව දරාගත නොහැකි තැන ඇය ඉකි ගසා හැඬුවා ය. තවුසකු බඳු නිවුණ සිතැති කලාකරුවා මෙතරම් පැහැදිළිව දිස් වන තමාගේ සිත හඳුනා නොගන්නේ මන්දැයි තේරුම් ගත නොහැකිව ඇය වැළපුණා ය. තමා ඔහුට පෙම් කරන බව වදනින් නොකීවද ඔහු එය දැන සිටිය යුතු ය. ඔහු එය තේරුම් ගත යුතු ය. එසේ නොවන කළ ගෞරවණීය ගුරුවරයාට තම සිතැගි කෙලෙස නම් හෙළිදරව් කරන්නදැයි ඇය නොදත්තා ය.

අදත් විශ්වජිත් ගේ කලාගාරයට නොඑන්නෙමැයි ඇය මුල දී සිතා සිටියා ය. එසේ වුව ද දහවල් වන විට ඔහු නොදැක සිටීමේ කාන්සිය ඒ සිතිවිල්ල නසා දැමුවේ ය.

විශ්වජිත් කිසිදිනෙක ඉල්ලා නොසිටිය ද මේ කලාගාරය සැමදාම පිරිසිදු කළේ ශාමිලා ය. දේවදාසියක රන් දෙවොලෙහි තේවාවන් කරන්නා සේ මහත් භක්තියකින් ඇය ස්වේච්ඡාවෙන්ම සෑම දා ම මේ කාරිය ඉටු කළා ය. දින කීපයක් ඒ යුතුකම පැහැර හැරීම ගැන පසුතැවීමකින් යුතු ව ම ශාමිලා කොස්සක් ගෙන බිම අමදින්නට පටන් ගත්තා ය.

විශ්වජිත් මහත් ඕනෑකමකින් නිමක-රමින් සිටි ශෝකී ඇස් ඇති ගැහැණිය ගේ සිත්තම තවමත් ඊසලය මත රඳවා තිබෙනු ඇය දුටුවා ය. නිරායාසයෙන් එදෙසට ඇදුණු ඇය අනිමිස ලෝචනයෙන් සිත්තම නැරඹුවා ය. ඔහු මේ නිම කරමින් සිටින්නේ ජීවමාන කාන්තාවක ගේ රූපය නම් ඒ කාන්තාව කෙරෙහි ඔහුගේ ඇති අති මහත් ආකර්ශනය මේ සිත්තම තුළින් දෘෂ්‍යමාන වන්නේ යයි ශාමිලාට සිතුණි. ඒ හැඟීම ඇගේ සිත කීරි ගස්සන්නට සමත් විය. මෙතුවක් කාලයක් කිසිවකු වෙනුවෙන් විවර නොවූ ඔහුගේ හදවත සසළ කරන්නට සමත් කාන්තාවක සිටින බව සිතීම පවා ඇගේ සිත මහත් සේ පෙළා දමන්නක් විය.

යම් කිසිවකු කලාගාරයේ දොර සීනුව නාද කරයි. ශාමිලා කරමින් සිටි කාරිය නවතා ඉදිරියට ගියා ය.

"මිස්ටර් විශ්වජිත් ඉන්නවද..?" දොර ඉදිරියේ පෙනී සිටි කාන්තාව ඇසුවා ය. ඇයට පිළිතුරු දෙනු වෙනුවට ශාමිලා විශ්මයෙන් ඇගේ මුහුණ බලා සිටියා ය. විශ්වජිත් මහත් ඕනෑකමකින් අඳින් සිත්මේ සිටින්නේ මැය නොවේ ද? සිත්තමේ ජීවමාන වන ශෝකී ඇස් ඇත්තිය මැය නොවේ ද?

"මම අමන්දි.. විශ්වජිත් දන්නවා මං එන බව.. කරුණාකරලා කියන්න මං ඇවිත් ඉන්නවා කියලා.." අමන්දි විස්මයෙන් බලා සිටිනා තරුණියට නැවත කීවා ය.

ශාමිලා වදනකුදු නොදොඩා දොර වෙතින් මෑත්ව ඇයට ඇතුළට එන්නට ඉඩ දුන්නා ය.

මතු සම්බන්ධයි

# බලවත්තු දුම්බර රක්ෂිතය වනසති

සජීව චාමිකර
පරිසර සංරක්ෂණ භාරය

ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 0.32% ක් පමණ වන දුම්බර (නකල්ස්) අඩවියේ මුළු ලොවින් ම මෙහි පමණක් වාර්තා වන ශාක විශේෂ 6 ක් පෘෂ්ඨවංශී සත්ත්ව විශේෂ 16 ක් හා අපෘෂ්ඨවංශී සත්ත්ව විශේෂ 5 ක් වෙති. එපමණක් නො ව මහවැලි ගඟේ පෝෂක බිම් අතුරින් 30% ක් ආවරණය වන්නේ ද දුම්බර අඩවියෙනි. එවන් සුවිශේෂත්වයක් හිමි දුම්බර අඩවියේ ආරක්ෂාව තහවුරු කිරීම සිදු කළ යුතු අවධියක දුම්බර අඩවිය පුරා හෝටල් ඉදිකරමින් දුම්බර අඩවිය වැනසීමේ මහා මෙහෙයුමක් ක්‍රියාත්මක වේ.

එහෙත් නකල්ස් සංරක්ෂණ වනාන්තරයේ භාරකරුවාවන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා නකල්ස් පරිසර ආරක්ෂක ප්‍රදේශයේ භාරකරුවා වන මධ්‍යම පරිසර අධිකාරිය දුම්බර අඩවිය වනසන්නන්ට රිසිසේ ක්‍රියා කිරීමට ඉඩ දී නිද්‍රාශීලී ව සිටියි. එහි ප්‍රතිඵලය වන්නේ අද වන විට දුම්බර අඩවියේ සෑම අස්සක් මුල්ලක් නෑර ම හෝටල් ඉදිකිරීම ය.

මේ මොහොතේ පවා දුම්බර අඩවියේ ජෛව ප්‍රජාවටත් අනාගත පැවැත්මටත් බලපෑම් ඇති වන ආකාරයෙන් තැනින් තැන සංචාරක හෝටල් ගණනාවක් ඉදි කර තිබේ. තවත් හෝටල් ගණනාවක් ඉදි කරමින් පවතී. නකල්ස් සංරක්ෂණ වනාන්තරය තුළ ගිරිස්වත්ත කොස්ගොල්ලවත්ත කෝබට්ගැප් අට්ටලවෙට්ටුව (තංගප්පුව මාර්ගයේ) ගෝනමඩවත්ත(රිවස්ටන් ප්‍රදේශයේ) පතන හා සුදුගල යන නකල්ස් සංරක්ෂණ වනාන්තරයට පවරා ගැනීමට නියමිත ප්‍රදේශයන්හි පවා මේ වන විට ද හෝටල් ඉදිකර තිබෙනු දැක ගත හැකි ය.

2010 වසරේ දී නීති විරෝධී ලෙස ඉදි කිරීම් ආරම්භ කළ හිටපු ගුවන් හමුදාපති ගේ හෝටලයේ වැඩ කටයුතු අද වන විට අවසන් කර තිබේ. සුදුගල ප්‍රදේශයේ ඉදිකළ මේ හෝටලය පිහිටා ඇත්තේ දුම්බර අඩවියේ හොඳින් සැඟවගත් ප්‍රදේශයක ය. රත්තොට * ඉලුක්කුඹුර (බී 274 මාර්ගය) මාර්ගයේ 27 හා 28 කිලෝමීටර කණු අතරින් සුදුගල ප්‍රදේශය දක්වා විහිදී ඇති කරත්ත මාර්ගයේ කිලෝමීටර 8 ක් පමණ දුරින් මාර්ගය අවසානයේ මේ හෝටලය පිහිටා ඇත. රෝයි ද සිල්වා යන අයට අයත් ව තිබූ රත්නින්ද සුදුගල හෙක්ටයාර 21.915 ක් වන ඉඩම හිටපු ගුවන් හමුදාපති මාණ්ඩලික ප්‍රධානී එයාමාෂල් රොෂාන් ගුණතිලක මහතා විසින් මිල දී ගනු ලැබ මේ විශාල හෝටලය ඉදි කරන ලදි. මේ ඉඩම ලග්ගල ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අනුව පවරා ගනු ලැබීමට නියෝග නිකුත් කළ ඉඩමකි. එවන් ඉඩමක කිසිදු ඉදිකිරීමක් හෝ සංවර්ධන කටයුත්තක් සිදු කළ නොහැකි වුවත් ගුවන් හමුදා සෙබළුන් ගේ ආරක්ෂාව යටතේ මේ හෝටලය ඉදි කළ අතර අද වන විට ද ඒ ප්‍රදේශයට කිසිවකුට ඇතුළු නොවිය හැකි ආකාරයට ආරක්ෂාව යොදා ඇත. මේ හෝටලයේ ප්‍රධාන පිවිසුම් මඟ වන රත්තොට * ඉලුක්කුඹුර මාර්ගයේ එඩී. සෑය්කහ යනුවෙන් සඳහන් නාම පුවරුවක් ද ඉදි කර තිබුණි. ඒ නාම පුවරුව යටින් පරිසර මවු නිති සුරකිමු ලෙස සඳහන් කරමින් මේ හෝටලයෙන් දුම්බර අඩවිය වැනැසීම සිදු කැරේ. ඒ බව හොඳින් තහවුරු වන්නේ මේ හෝටලයට පිවිසීමට දුම්බර අඩවිය ඔස්සේ තවත් මාර්ගයක් ලෙස කබරගල නිකොලොය හරහා සුදුගල දක්වා මාර්ගයක් වනාන්තර හා පතන් බිම් ඔස්සේ ඉදි කිරීමෙනි. නීතිය ක්‍රියාත්මක කිරීමට සිටින රටේ වගකිව යුතු පුද්ගලයන් ම තම බලය අයුතු ලෙස යොදවා නීති උල්ලංඝනය කරමින් මෙවන් දෑ සිදු කිරීම කනගාටුවට කරුණකි.

ඒ වරද පෙන්නා දුන් විට ද තම බලය අයුතු ලෙස භාවිත කරමින් මේ හෝටලය අඛණ්ඩ ව පවත්වාගෙන යෑම පිළිබඳ ව අපි කම්පාවට පත් වෙමු.

පිටවල ගෝනමඩවත්තේ අක්කර දෙකක භූමියක ඉදිකර ඇති අස්නාර් එස්. මුසාජි යන අයට අයත් හෝටලය හා ඒ ආශ්‍රිත වනාන්තර ඉඩම් නකල්ස් සංරක්ෂණ වනාන්තරයට පවරා ගැනීමේ කටයුතු නතර කිරීම සඳහා ද පියවර ගෙන තිබේ. ඉඩම් අමාත්‍යංශය මඟින් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 50 වන වගන්තිය යටතේ අමාත්‍යවරයාට (හිටපු ඉඩම් අමාත්‍ය ජීවන් කුමාරතුංග මහතා විසින්) ඇති බලතල භාවිත කරමින් පවරා ගැනීමේ කටයුතු මෙලෙස නතර කිරීමට පියවර ගෙන තිබීම කනගාටුවට කරුණකි. මෙය සංරක්ෂණ කටයුතු සඳහා අහිතකර බලපෑම් ඇති කරන වැරැදි පූර්වාදර්ශ ලබා දීමකි.

ගිරිස්වත්තේ හෝටලය ඉදි කර ඇත්තේ පොලොන්නරුවේ රිළවුන් පිළිබඳ ව පර්යේෂණ සිදු කළ ආචාර්ය වුල්ෆ ඩිටස් නම් විදේශිකයා ය. මහල් තුනකින් සමන්විත මේ හෝටලය විදේශීය පර්යේෂකයන් සඳහා ලබා දීමට නියමිත බව සඳහන් වේ. ඉතා සුවිශේෂී වනාන්තරයක් ඇසුරේ මේ ආකාරයෙන් විදේශිකයකු පවත්වාගෙන යන හෝටලයකින් සිදු විය හැක්කේ කුමක් ද? මෙමඟින් කවර ආකාරයේ ජාන සම්පත් අප රටින් පිටමං වනු ඇද්ද යන්න පිළිබඳ ව බලධාරීන් සිතා බැලිය යුතු ය.

දුම්බර අඩවියේ අනවසර හා හානිකර හෝටල්



පිටවල ගෝනමඩවත්තේ පිහිටි මාතලේ කෝට්ටේගොඩ බතික් ආයතනයේ හිමිකරුට අයත් ග්‍රීන් නෙස්ට් නම් නිවාඩු නිකේතනය සමස්ත දුම්බර අඩවියට ම මහා හිසරදයකි. මෙහි හිමිකරු වන නිශාන්ත කෝට්ටේගොඩ (සුසන්ත පුංචිනිලමේ අමාත්‍යවරයාගේ හිටපු සම්බන්ධීකරන ලේකම්) තම දේශපාලන සබඳතා භාවිත කරමින් දුම්බර අඩවියේ හා ඒ ආශ්‍රිත පැරැණි ගම්මානවල ඉඩම් විවිධ පුද්ගලයන්ට ලබා දෙයි. ඒ ඉඩම්වල මේ වන විට හෝටල් ඉදිකිරීම සිදු කරයි. මෙහි දී රටේ ඉහළ ම පෙළේ අය ගේ නම් භාවිත කරමින් මේ ක්‍රියාවලියේ නිරත වනු පෙනෙයි. මේ නිසා දුම්බර අඩවියේ ඇටැන්වල වැනි සාම්ප්‍රදායික ගම්මානවල ජනතාව ගේ ජීවන පැවැත්මටත් දුම්බර අඩවියේ ජෛව ප්‍රජාව ගේ ජීවන පැවැත්මටත් බොහෝ බලපෑම් එල්ල වී ඇත.

මේ ග්‍රීන් නෙස්ට් නිවාඩු නිකේතනයේ නැවතී සිටි පර්යේෂණ කණ්ඩායමක් පසුගිය දා දුම්බර අඟ කටුස්සන් විශාල ප්‍රමාණයක් වනාන්තරයෙන් එකතු කර තිබුණි. මේ තත්ත්වයන්ට දුම්බර අඩවියට මුහුණ දීමට සිදු වන්නේ ද මේ හානිකර හා අනවසර හෝටල් නිසාවෙනි.

පිටවල ගෝනමඩවත්තේ පිහිටි ඩී. එච්. සී. මනතුංග යන අයට අයත් අක්කර 149 කින් යුත් වනාන්තර භූමිය හා ලග්ගල බංගලාව හෙවත් කොතලාවල බංගලාව නකල්ස් සංරක්ෂණ වනාන්තරයට පවරා ගැනීමේ කටයුතු නතර කිරීමට ද මහත් බලපෑම් සිදු වෙමින් පවතී. කෝබට්ගැප් ප්‍රදේශයේ උපුල් හටන්ගොඩ යන අය පවත්වාගෙන යන හෝටලයට විදේශීය සංචාරකයෝ නිරන්තරයෙන් පැමිණෙති. මෙසේ පැමිණෙන විදේශිකයෝ අනවසරයෙන් සංරක්ෂණ වනාන්තර තුළට ද ඇතුළු වෙති. ඔවුන් එහි සිදු කරන ක්‍රියාකාරකම් පිළිබඳ ව සොයා බැලීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රමාණවත් නිලධාරීන් නොමැත. මේ තත්ත්වය දැනට දෙගුණ තෙගුණ වී ඇත්තේ අලුතෙන් සංචාරක හෝටල් බොහොමයක් දුම්බර අඩවිය පුරා පිහිටා තිබෙන නිසා ය.

හෙක්ටයාර 21000 ක් පමණ ප්‍රදේශයක් පුරා ව්‍යාප්ත ව ඇති දුම්බර කඳුකරයෙන් ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 0.32% ක් පමණ ආවරණය වී ඇත. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මිණිපේ උඩදුම්බර පාතදුම්බර හා පන්විල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරේ සහ මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල. රත්තොට ලග්ගල පල්ලේගම හා විල්ගමුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහේ දුම්බර කඳුකරය ව්‍යාප්ත ව තිබේ.

මතු සම්බන්ධයි


